ජනසමාජයේ චින්තනය හැඩගැස්වීම සඳහා භාෂාවෙන් ලැබෙනා දායකත්වය කෙතරම්ද යන්න පිළිබඳව අපි විටින් විට කතා කොට ඇත්තෙමු. ඒ අනුව, වඩාත් ශිෂ්ට සම්පන්න චින්තනයක් හැඩගැස්වීමෙහි ලා, වඩාත් ශිෂ්ට සම්පන්න භාෂාවක් මාධ්‍ය ඔස්සේද හැසිරවීම අවශ්‍ය කරුණක් ලෙසින් දැක්විය හැක.

"කුඩ්ඩා", "මත්ලෝලියා" වැනි යෙදුම් ඒ ආකාරයෙන් බලනා විට ශිෂ්ට සම්පන්න චින්තනයකට දායක වන ශිෂ්ට සම්පන්න යෙදුම් ලෙසින් සැලකිය හැකි වේද?

එසේම මෙවන් යෙදුම් ඔස්සේ නිර්මාණය වන සමාජ ගර්භාව ඔස්සේ, මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වීවන්ට ඉන් මිදී නැවත සමාජයට ඇතුළත් වීම සඳහා වන දෙවන අවස්ථාවක් පවා නොලැබී යන්නේ නොවේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima #Divaina #Aruna #Lankadeepa